පාපයක් නැති ඥාතී සම්බන්ධකම් බිඳ නො දමන ආකාරයේ යම් ප්රාර්ථනාවක් කරන මුස්ලිම්වරයකුට ආකාර තුනෙන් එක් ආකාරයකින් හෝ අල්ලාහ් ඔහුට එය පිරිනමනු ඇත. එනම්, එක්කො ඔහුගේ ප්රාර්ථනාව ඔහුට කල් ඇතිව ඉක්මන් කරනු ලැබේ. එක්කො මතුලොවෙහි එය ඔහු වෙනුවෙන් රැස්කර තබයි. එක්කො ඒ හා සමාන නපුරක් ඔහුගෙන් ඉවත් කරයි. ඔවුහු: "එසේ නම් අපි වැඩි කරන්නෙමු" යැයි පැවසුවෝය. එතුමාණෝ "අල්ලාහ් ඉතා උතුම්ය" යැයි පැවසුහ

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්රකාශ කළ බව අබූ සඊද් (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: පාපයක් නැති ඥාතී සම්බන්ධකම් බිඳ නො දමන ආකාරයේ යම් ප්රාර්ථනාවක් කරන මුස්ලිම්වරයකුට ආකාර තුනෙන් එක් ආකාරයකින් හෝ අල්ලාහ් ඔහුට
එය පිරිනමනු ඇත. එනම්, එක්කො ඔහුගේ ප්රාර්ථනාව ඔහුට කල් ඇතිව ඉක්මන් කරනු ලැබේ. එක්කො මතුලොවෙහි එය ඔහු වෙනුවෙන් රැස්කර තබයි. එක්කො ඒ හා සමාන නපුරක් ඔහුගෙන්
ඉවත් කරයි. ඔවුහු: "එසේ නම් අපි වැඩි කරන්නෙමු" යැයි පැවසුවෝය. එතුමාණෝ
"අල්ලාහ් ඉතා උතුම්ය" යැයි පැවසුහ. [صحيح] [رواه أحمد]

පාපකම් හා අපරාධ කිරීමට තමන්ට පහසු කර දෙන මෙන් ඉල්ලා අයදින පාපී ප්රාර්ථනාවකින් තොරව හා තම දරුවන් හා තම සමීප ඥාතී සම්බන්ධකම් බිඳ දමන මෙන් ඉල්ලා අයදින ආකාරයේ ප්රාර්ථනාවකින් තොරව මුස්ලිම්වරයකු අල්ලාහ්ගෙන් යම් ප්රාර්ථනාවක් ඉල්ලා සිටින්නේ නම් ඔහුගේ ප්රාර්ථනාවට කරුණු තුනෙන් එක් ආකාරයකින් හෝ අල්ලාහ් ඔහුට පිරිනමනු ඇත: එක්කො ඔහුගේ ප්රාර්ථනාව ඔහු වෙනුවෙන් කල් ඇතිව පිළිගෙන ඔහු ඉල්ලන දෑ ඔහුට පිරිනමනු ඇත. එක්කො මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ තරාතිරම් උසස් කිරීමෙන් හෝ පාපකම් සඳහා සමාව දී, කරුණාව දැක්වීමෙන් හෝ ඔහුට එහි ප්රතිඵලය ප්රමාද කර දෙනු ඇත. එක්කො ප්රාර්ථනාවේ ප්රමාණයට ඒ හා සමාන නපුරක් මෙලොවෙහිදී ඔහුගෙන් ඉවත් කරනු ලැබේ. එවිට සහාබාවරු, "එසේ නම්, මෙම භාග්යන් අතරින් එකක් හෝ ලබන්නට අපි වැඩියෙන් ප්රාර්ථනා කරන්නෙමු." යැයි පැවසූහ. එවිට (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ, "ඔබ ඉල්ලා සිටින දෑට වඩා අල්ලාහ් අබියස ඇති දෑ අධිකය, ඉමහත්ය. ඔහු ඒවා පිරිනැමීමෙන් කිසිදු අඩුවක් නොවන අතර අවසන් වී යන්නේ ද නැත."

http://www.sunnah.global/hadeeth/si/show/5100